**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය - 2021**

---------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ "මණ්ඩලය" හා මණ්ඩලය සහ එහි පරිපාලිතයෙහි "සමූහය" 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණිත නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 හා 61 වගන්ති ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය සහ ක්ෂය ක්‍රමය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු වුවත් මණ්ඩලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ජංගම නොවන වත්කම් වල පිරිවැය රු.මිලියන 54.48 ක් වූ වත්කම් වර්ෂ 20 කට අධික කාලයක සිට හීනවන ශේෂ ක්‍රමය යටතේ තවදුරටත් ක්ෂය කරමින් පැවතියද, එම වත්කම් අතරින් තව දුරටත් භාවිතා කරනු ලබන වත්කම් හඳුනා ගෙන ඵලදායි ජීවිත කාලය හා ක්ෂය ක්‍රමය නිවැරදිව සමාලෝචනය නොකිරීමෙන් වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව නිවැරදි කිරීමටත් තවදුරටත් භාවිතයට නොගන්නා වත්කම් සුදුසු පරිදි අපහරණය කිරීමටත් කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී හඳුන්වා දීමට නියමිත ස්ථාවර වත්කම් ප්‍රතිපත්තිය මඟින් මණ්ඩලයේ ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය හින වන ශේෂ ක්‍රමයේ සිට සරල මාර්ග ක්‍රමයට වෙනස් කිරීමට බලාපොරොත්තු වන අතර, ඉන්පසු මෙවැනි වැරදි පැන නොනඟිනු ඇත. එසේම අවශ්‍යතාවය මත සම්පූර්ණ ක්ෂය වුවද භාවිතයේ පවතින වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 79 ඡේදයට අනුව හෙළිදරව් කිරීමට කටයුතු කරන්නෙමු. | වත්කම් නැවත අගය කර මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු බව. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් 1981 සිට 2020 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල සේවායෝජකයින් 4761 කට අදාලව අයකරගෙන තිබූ 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 862.78 ක දායක මුදල් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව ඒ ඒ සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර නොකර වෙනත් තාවකාලික ගිණුම්වල රඳවා තබාගෙන පැවතුණි. මේ හේතුවෙන් සාමාජිකයින්ට තම දායක මුදල් ආපසු ලබා ගැනීමේ දී ගැටලු සහගත තත්ත්වයන් ඇති වන බව නිරීක්ෂණය විය. | මෙම දායක මුදල් වලින්, රු.මිලියන 189 ක් 2022 ජුනි 20 වන විට එක් එක් සාමාජික ගිණුම් වලට බැර කරන ලදි. ඒ අනුව 2022 ජුනි 20 වන විට තවදුරටත් සේවායෝජකයින් 3722 ක ගෙන් අයකර ගත් රු.මිලියන 645 ක් එක් එක් සාමාජිකයින්ගේ ගිණුම්වලට බැර කල යුතුව ඇත.<br>මීට අමතරව දායක මුදල් බැංකු ගත කිරීම සඳහා අප මණ්ඩලය විසින් පවත්වාගෙන යන බැංකු ගිණුම් වෙත බැර කර ඇති තහවුරු කර නොගත්/හඳුනා නොගත් මුදල් අවිනිශ්චිත ගිණුමකට බැර කරනු ලබන අතර 2022 මැයි 31 දින විට අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.මිලියන 16.24 ක් දක්වා අඩුවී ඇත. | දායක මුදල් බැරවිය යුතු සාමාජිකයන් නිවැරදිව හා කඩිනමින් හඳුනාගත හැකි ආකාරයට සමාජික මුදල් අයකිරිමේ ක්‍රමවේදය වැඩිදියුණු කිරිම හා හඳුනා නොගත් සාමාජික මුදල් කඩිනමින් හඳුනාගැනිම ට අවශ්‍ය කටයුතු සම්පාදනය කල යුතු විම. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ සාමාජිකයන් වෙනුවෙන් ලැබිය යුතු එකතුව රු.මිලියන 315.76 ක හිඟ දායක මුදල් හා අධිභාර අයකර ගැනීම වෙනුවෙන් දිවයින පුරා නඩු 3360 ක් ගොනු කර තිබුණි. ඒ අතරින් සක්‍රීය කළ යුතු මට්ටමේ පවතින නඩු හා විවෘත වරෙන්තු සංඛ්‍යාව 1070 ක් වූ අතර එම නඩුවලට අදාලව අයකර ගත යුතුව පවතින මුදල රු.මිලියන 44.70 ක් විය. මෙසේ හිඟ දායක මුදල් හා අධිභාර අයකර ගැනීමට ප්‍රමාද වීමෙන් සාමාජිකයින්ට තම දායක මුදල් අහිමි විමේ අවධානමක් පවතින බව නිරීක්ෂණය විය. | මෙම නඩු ස්ථිර වශයෙන්ම අක්‍රීය තත්ත්වයේ නොපවතින අතර එම නඩු සම්බන්ධයෙන් අදාල අධිකරණ විසින් ලබා දි ඇති උපදෙස්වලට අනුකූලව අවශ්‍ය ඉදිරි පියවර කඩිනමින් ගෙන විවෘත අධිකරණයේ එම නඩු කැඳවා අදාල හිඟ මුදල් අයකර ගැනීමේ නිසි නෛතික ක්‍රමවේදය අනුගමනය කරනු ලබයි. විවෘත වරෙන්තු නිකුත් කර ඇති නඩුවලට අදාලව වරෙන්තු පිටපත් අදාල අධිකරණයන්ගෙන් පැමිණිල්ලට ලබාගෙන එම වරෙන්තු කඩිනමින් ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය කඩිනම් පියවර ගනු ලබයි. | සාමාජිකයන්ගේ හිමිකම තහවුරු කිරීම සඳහා ලැබිය යුතු මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. |
| (ආ) | වර්ෂ ගණනාවක සිට ඇල්කඩුව වැවිලි සමාගමෙන් ලැබිය යුතුව පැවති ණයකර පොළී මුදල් වලින් තවදුරටත් ලැබිය යුතු රු. මිලියන 9.39 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | මෙම හිග මුදල් ගෙවන ලෙස අදාල සමාගමට ලිපි කිහිපයක් යවා ඇති අතර අවසන් වරට 2022 ජනවාරි 06 දින ලිපියක් යවා ඇත. ඔවුන් පවසා සිටින්නේ කොවිඩ් තත්වය හමුවේ සමාගම මූල්‍ය අපහසුතාවයට පත්ව ඇති බවයි. | පසු විපරම් කටයුතු සිදුකළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | දැනට ඈවර කරමින් පවතින වනික් සමාගමෙහි පොරොන්දු නෝට්ටුවල ආයෝජනය කර තිබූ රු.මිලියන 12.17 ක් හා ණයකරවල ආයෝජනය කර තිබූ රු.මිලියන 7.45 ක් පිළිවෙලින් 2002 හා 2007 වර්ෂවලදී උපලබ්ධි විය යුතුව තිබුණි. තවද, වනික් සමාගමෙහි ණයකරවල ආයෝජනයෙන් 2006 දෙසැම්බර් 31 දක්වා අයවිය යුතු පොළී ආදායම් රු.මිලියන 15.21 ක් හා පොරොන්දු නෝට්ටුවල ආයෝජනයෙන් අයවිය යුතු පොළී ආදායම් රු. 367,724 ක් ද අයකර ගත යුතුව පැවතුණි. එම මුදල් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පැවතියද 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට මණ්ඩලයට හැකි වී නොතිබුණි. | මෙම සමාගම ඈවර කිරීම සඳහා තෙවන පාර්ශවයක් විසින් කරන ලද ඉල්ලීම මත ඈවරකරුවෙකු පත්කරන ලෙස උසාවියෙන් නියම කොට ඇත. එම කටයුතු තවම නිම වී නැත. | පසු විපරම් කටයුතු සිදු කළ යුතු වීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනත | අතිකාල සඳහා ගෙවීම් කිරීමේ දී අතිකාල පැයකට සාමාන්‍ය පැයක වැටුප මෙන් එක හමාරක් ගෙවිය යුතු වුවද, මණ්ඩලය විසින් අතිකාල පැයකට පැය එක හමාරක් සහ සෙනසුරාදා/ඉරිදා දිනවල අතිකාල පැය 8 ක් සම්පූර්ණ විමත් සමඟ දිනක වැටුපක් ද එකතු කර අතිකාල ගෙවීම් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී මණ්ඩලයේ අතිකාල පිරිවැය රු.20,455,000 ක් වී තිබුණි. තවද, පනත ප්‍රකාරව මණ්ඩලයේ නිලධාරින් සතියකට දින පහමාරක් සේවය කළ යුතු වන අතර වාර්ෂික නිවාඩු දින 21 කට පමණක් ඉඩ දී ඇති නමුත් ඊට පටහැනිව මණ්ඩලයේ නිලධාරින්ට වාර්ෂික නිවාඩු දින 42 ක් ලබා ගැනීමට හා සතියකට දින 5 ක් පමණක් සේවය කිරීමට ඉඩ දී තිබුණි. | 1988 වර්ෂයේ සිට මණ්ඩලයේ සේවකයින්ට අතිකාල සඳහා ගෙවීම් සිදුකරනු ලබන්නේ සාප්පු හා කාර්යාල සේවක පණතෙහි විධි විධාන වලට අනුව වන අතර, ඊට අමරතව නිවාඩු දිනක පැය 8 ක කාලයක් සම්පූර්ණ කිරීම මත අතිකාල ප්‍රමාණයට අමතරව දිනක වැටුපක ප්‍රමාණයද ගෙවීම් කරනු ලබයි. මෙම වරප්‍රසාදය කාලයක් තිස්සේ භුක්ති විඳ ඇති බැවින් එය ඉවත් කළහොත් සේවක නොසන්සුන්තාවයක් ඇතිවී ආයතනයේ කාර්මික සාමය බිඳ වැටිය හැකි බැවින් එය වෙනස් කිරීමට වර්තමාන කළමනාකාරිත්වයට අපහසු වි ඇත.<br>තවද, සේවකයින්ට වාර්ෂිකව නිවාඩු 42 ක ප්‍රමාණයක් කලක සිට ලබාදී ඇති අතර, එය අනෙකුත් සංස්ථා හා මණ්ඩල වලට අනුව සිදුකර තිබේ. | සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් ලෙස අතිකාල සහ නිවාඩු සම්බන්ධයෙන් එම පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති පීඊඞී 12/ දරන රාජ්‍ය | මණ්ඩලයෙහි දැනට ක්‍රියාත්මක වන මූල්‍ය හා පරිපාලන කාර්යය පරිපාටි සංග්‍රහයන් මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන | මණ්ඩලය ව්‍යවස්ථාපිත ආයතනයක් බැවින් මූල්‍ය ගනුදෙනු වලදී මූල්‍ය රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන ඒ ආකාරයෙන්ම භාවිතා කරනු ලැබේ. | මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනිම සඳහා |

| | | | | |
|---|---|---|---|---|
| | ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14.2 වගන්තිය | නොතිබුණි. | එසේ වුවත් මෙහෙයුම් කටයුතු ඉටුකර ගැනීමේ පහසුව තකා අභ්‍යන්තරව සකසන ලද මූල්‍ය කාර්යය පරිපාටියක් සකසා ඇති අතර, එය හුදෙක්ම උපදෙස් මාලාවක් මිස නිතිමය ලියවිල්ලක් ලෙස භාවිතා නොවේ. එසේ වුවද, මණ්ඩලයේ මූල්‍ය කාර්යය පරිපාටි සංග්‍රහය සඳහා විගණන කමිටුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති අතර, භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. | කටයුතු කල යුතු වීම. |
| (ඇ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2000 ජනවාරි 11 දිනැති පීඑෆ්/පීඊ 5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මහා භාණ්ඩාගාරයේ නිසි අවසරයකින් තොරව කාර්ය මණ්ඩලයට අතිරේක දීමනා, දිරිදීමනා හා වෙනත් වර්ගවල මූල්‍යමය ප්‍රතිලාභ ලබා නොදිය යුතු වුවද, මණ්ඩලය විසින් 2021 වර්ෂයේදී ඉතිරිකර ගත් නිවාඩු මත දීමනා ලෙස රු.මිලියන 23.77 ක් ද, වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණයන් ලෙස රු.මිලියන 96.48 ක් ද, නිවාස ණය ප්‍රතිපූර්ණයන් ලෙස රු.මිලියන 10.68 ක් ද, ලෙස එකතුව රු.මිලියන 130.93 ක් මහා භාණ්ඩාගාරයේ නිසි අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණි. | ඉතිරි නිවාඩු කාලයක් තිස්සේ භුක්ති විඳි වරප්‍රසාදයක් බැවින් සේවක නොසුන්සුන්තාවයක් ඇති විය හැකි බැවින් වර්තමාන කළමනාකාරිත්වයට එය කිරිමට අපහසු වි ඇත. වෛද්‍ය වියදම් යෝජනා ක්‍රමය 1991 වර්ෂයේ සිට ආරම්භ කර ඇති අතර, එහිදි වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය සේවකයාගේ දායකත්වයක් සහිතව කරන බැවින් මහා භාණ්ඩාගාර අනුමැතිය අවශ්‍ය නොවන බව විගණන කමිටුවේදි සාකච්ඡා කරන ලදි. නිවාස ණය ප්‍රතිපූර්ණය සඳහා අනුමැතියට ලිපියක් යොමු කිරිමට අපේක්ෂා කෙරේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සියලුම දීමනා ක්‍රමයන් සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු වීම. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1645 හා 1647 | මණ්ඩලය සතු වාහනවලට අදාල ලොග් පොත් හා දෛනික ධාවන සටහන් අවශ්‍ය තොරතුරු ඇතුලත් කර යාවත්කාලීනව පවත්වාගත යුතු වුවද, මණ්ඩලයෙහි ලොග් පොත් හා දෛනික ධාවන සටහන් එසේ යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි. තවද, 268 වැනි පොදු ආකෘති පත්‍රය ප්‍රකාරව දෛනික ධාවන සටහනක් තබා ගත යුතු අතර එහි ගමන් කළ දුර, ඉන්ධන ලීටරයකට සටහන් කරනු ලබන කිලෝමීටර් ගණන ,ආරම්භක සහ අවසාන මයිලෝමීටරයෙහි අගය, කිලෝමීටර ප්‍රමාණය ආදිය දක්වා ධාවන සටහනක් දෛනිකව තුලනය | දැනට මණ්ඩලය විසින් සකසාගත් ධාවන සටහන් පොත් භාවිතා කරන අතර, ඉදිරියට රජයේ අනුමත පොදු ධාවන සටහන් පොත් භාවිතයට කළමනාකරිත්වයේ අනුමැතිය ඉල්ලීමට කටයුතු කර ඇත. කෙසේ වෙතත් අප විසින් භාවිතා කරනු ලබන ධාවන සටහන් පොතෙහි ආරම්භක මීටරය අවසාන මීටරය හා ධාවනය කලදුර ප්‍රමාණය සඳහන් කරනු ලැබේ. තවද, නිලධාරින්ගේ වාහන සම්බන්ධයෙන්ද ඉදිරියේදි වාර්තා තබා ගැනිමට අවශ්‍ය කටයුතු කිරිමට බලාපොරොත්තු වේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | කලයුතු වුවත්, මණ්ඩලය විසින් භාවිතා කරනු ලබන දෛනික ධාවන සටහන් පොත්වල එසේ දෛනිකව තුලනය කිරීමක් සිදුකර නොතිබුණි. එසේම වාහන භාර නිලධාරීන් විසින් තමා භාරයේ ඇති මෝටර් වාහන පිළිබඳව තොරතුරු දැක්වෙන ලැයිස්තුවක් තබාගත යුතු වුවද, එවැනි ලේඛනයක් නඩත්තු කර නොතිබිණි. | | |
| (ඉ) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 හි 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකට පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත් වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කල යුතු වුවද මණ්ඩලය සතු වාහන සම්බන්ධයෙන් 2020 හා 2021 වර්ෂවලදී ඒ අනුව කටයුතු කළ බවට විගණනයේ දී සාක්ෂි නිරීක්ෂණය නොවීය. එසේම එම චක්‍රලේඛයේ 3.3 ඡේදය අනුව වාහනයෙහි දැවෙන ඉන්ධන සම්බන්ධයෙන් සටහනක් ද පවත්වාගෙන ගොස් ඇති බව නිරීක්ෂණය නොවීය. | 2021 වසරේ ලොවටම බලපාන ලද කොරෝනා වසංගත තත්ත්වය නිසා මෙම ඉන්ධන දහන වාර්තා ලබා ගැනිමට අවශ්‍ය තරම් කාර්යාලය පවත්වාගෙන යාමට නොහැකි විය. 2022 වසරට අප මණ්ඩලයීය වාහන සඳහා ඉන්ධන දහන වාර්තා ලබා ගැනීමට අනුමැතිය 2022 පෙබරවාරි 10 වන දින ලබාගත් අතර පවතින ඉන්ධන හිඟය නිසා පරීක්ෂණ කල් දැමීමට සිදුවී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව දැවෙන ඉන්ධන සම්බන්ධ පරික්ෂාවක් කළ යුතු වීම. |
| (ඊ) | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා ගේ 2014 නොවැම්බර් 10 දිනැති අංක PE/IN/ETF /Genදරන ලිපිය | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කරන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට නිවාස ණය ලබා දීමේ යෝජනා ක්‍රමය යටතේ සියයට 4.2 ක පොලී අනුපාතය යටතේ එම ණය ලබාදිමට එකඟතාවය පල කර තිබුණද මණ්ඩලය විසින් සියයට 4 ක පොලී අනුපාතයක් යටතේ රු.මිලියන 02 දක්වා 2021 වර්ෂයේදී ද කාර්ය මණ්ඩලය සඳහා නිවාස ණය ලබාදී තිබූ අවස්ථා නිරීක්ෂණය විය. | නිවාස ණය මුදල් ලබා දීමට අදාලව 2021 මැයි 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකුව සමග නව ගිවිසුමකට ඇතුලත්ව ඇත. එම ගිවිසුම ප්‍රකාරව ණය නිකුත් කිරිමේදි පළමු මිලියන 2 ක සඳහා සියයට 4.2 ක පොළියක් සහ ඉතිරි මිලියනය සඳහා සියයට 7 ක පොළියක් අය කෙරේ. ඒ අනුව නව ගිවිසුමට අනුව මෙම යෝජනා ක්‍රමයේ තිබූ සියළු අඩුපාඩු නිවැරදි කිරිමට කටයුතු කරන ලද බව දැනුම් දෙමි. | මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය අනුව නිවාස ණය සඳහා පොළි අයකල යුතුවීම. |

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කරන කාර්ය මණ්ඩල නිවාස ණය යෝජනා ක්‍රමය සඳහා බැංකුව සමඟ එළඹ තිබූ ගිවිසුම අනුව සේවකයින්ගෙන් ආපසු අයකර ගන්නා මූලික මුදල් හා පොළී මුදල් මාස 03 කට වරක් මණ්ඩලය වෙත ප්‍රේෂණය කළයුතු වේ. එසේ වුවද, ඊට පටහැනිව බැංකුව විසින් එම මුදල් වර්ෂය අවසානයේ දී තැන්පත් ගිණුමේ ශේෂයට එකතු කර පෙන්වන බව විගණනයේ දී නිරීක්ෂණ විය. ඒ හේතුවෙන් වර්ෂය තුළදී එකතු කරන මුදල් හා පොළී මුදල් වෙනුවෙන් අදාළ වර්ෂය සඳහා මණ්ඩලයට කිසිදු ප්‍රතිලාභයක් හිමි නොවන බවද එම මුදල් වෙනත් ආයෝජන මාර්ගයක යොදාගත නොහැකි වන බව ද නිරීක්ෂණය විය. ඒ අනුව 2021 වර්ෂයේ ණය නැවත අයකර ගැනීම් රු.මිලියන 30.11 ක් හා පොළී අයකර ගැනීම් රු.මිලියන 6.68 ක් සඳහා ප්‍රතිලාභ කිසිවක් ලැබී නොතිබුණි. | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වරින් වර දැනුවත් කලද එම ණය නැවත අයවීම මාස 03 කට වරක් මණ්ඩලය වෙත ප්‍රේෂණය කර නොමැත. 2021 මැයි 21 ක්‍රියාත්මක නව ගිවිසුමට අනුව නැවත අයවීම මාස 03 කට වරක් අයකර ගැනීම විධිමත්ව සිදුකර ගැනීමට කටයුතු යොදා ඇත. | ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සමූහයේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 28,595 ක් හා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 28,569 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ සමූහයේ හා මණ්ඩලයේ ලාභ පිළිවෙලින් රු.මිලියන 28,017 ක් හා රු.මිලියන 28,007 ක් විය. ඒ අනුව සමූහයේ හා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය පිළිවෙලින් රු.මිලියන 578 කින් හා රු.මිලියන 562 කින් වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ පොළී ආදායම් රු.මිලියන 698 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵල වල වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ සාමාජිකයන් සඳහා බෙදා වෙන්කල හැකි ලාභය 2015වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා සැසඳීමේ දී රු.මිලියන 15,346 සිට රු.මිලියන 32,663 ක් දක්වා ක්‍රමයෙන් වර්ධනය වී තිබුණි. එහෙත්, 2015 වර්ෂයේදී සාමාජිකයන් වෙත සියයට 9 ක ප්‍රතිලාභ ප්‍රතිශතයක් ලබාදී තිබුණද 2019 වර්ෂය වන විට එය සියයට 8 ක් දක්වා අඩුකර තිබූ අතර 2021 වර්ෂය වන විට එය | සාමාජිකයන් සඳහා ලබා දෙන ලද ප්‍රතිලාභ ප්‍රතිශතය සියයට 9 සිට සියයට 7.25 ක් දක්වා දිගින් දිගටම අඩුවීමක් පෙන්නුම් කර ඇත්තේ මෙම කාලපරිච්ඡේදය තුල රජය මගින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයක් මත පදනම්ව ප්‍රතිපත්ති පොළී අනුපාතයන් අඩු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයේ ඉපයීම්ද සමානුපාතිකව අඩු අගයක් ගෙන ඇති බැවිනි. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ඍජුවම මණ්ඩලයේ ඉපයීම් කෙරෙහි බලපෑමක් ඇති | සාමාජිකයන්ගේ දායක මුදල් වලින් සැඳුම්ලත් අරමුදලක් වන බැවින් සාමාජිකයන්ට ඉහල ප්‍රතිලාභයක් ලබා දීමට කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| | සියයට 7.25 ක් දක්වා තවදුරටත් අඩුවී තිබුණි. | කරන බැවින් මණ්ඩලයේ වාර්ෂික ඉපයීම් ඵලදායිතාවය වාර්ෂිකව උච්චාවචනය වේ. | |
| (ආ) | මණ්ඩලයේ සාමාජිකයන් වෙත විවිධ සුභසාධන සේවාවන් ලබාදෙනු ලබන අතර එම එක් එක් සුභසාධන සේවාවන් යටතේ සාමාජිකයෙකුට පිරිනමන උපරිම මූල්‍යාධාර වටිනාකම පසුගිය වර්ෂ 11 ත් වර්ෂ 5 ත් අතර කාලයකින් පසුව ඉහළ දමා නොතිබුණු අතර එම වටිනාකම් ඉහළ දැමීම සම්බන්ධයෙන් කළමනාකරණය අවධානය යොමුකර නොතිබුණි. තවද, මණ්ඩලය විසින් හඳුන්වා දී ඇති ඉහත සඳහන් සාමාජික ප්‍රතිලාභ පිළිබඳව සාමාජිකයන් දැනුවත් කිරීම සඳහා ක්‍රියාවට නැංවිය යුතු වැඩ සටහන් 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත් කර තිබුණද එම වැඩසටහන් වර්ෂය තුලදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, ප්‍රවර්ධන සඳහා දරන ලද වියදමද දිගින් දිගටම අඩු වී ඇති බව නිරීක්ෂණය විය. | මණ්ඩලය මගින් සාමාජිකයන්ට ලබා දෙන සුභසාධන ප්‍රතිලාභ සාමාජිකයින්ගෙන් දායකත්ව මුදල් අය කර නොගෙන දෙනු ලබන ප්‍රතිලාභයකි. එම නිසා මණ්ඩලයේ සමස්ත අරමුදලට දරා ගත නොහැකි පරිමාවක් දක්වා මෙම සුභසාධන ප්‍රතිලාභ පුළුල් කිරීම විචක්ෂණ තත්ත්වයක් නොවේ. කෙසේ වුවත්, දැනට ලබා දෙන සුභසාධන ප්‍රතිලාභවල මූල්‍යමය අගය කාලීන තත්ත්වයන් සැලකිල්ලට ගෙන සංශෝධනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු වී ඇති අතර නව සුභසාධන ප්‍රතිලාභ කිහිපයක් හඳුන්වා දීමට ද අවශ්‍ය මූලික සංකල්ප සකස් කරමින් සිටී. | සාමාජිකයන්ගේ දායක මුදල් වලින් සැඳුම්ලත් අරමුදලක් වන බැවින් සාමාජිකයන්ට ඉහල ප්‍රතිලාභයක් ලබා දීමට කටයුතු කිරිම. |
| (ඇ) | සාමාජිකයන් සඳහා ලබාදෙන ශ්‍රමසුව රක්ෂණ ක්‍රමය යටතේ සාමාජිකයෙකුට ජීවිත කාලය තුළ වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය වෙනුවෙන් උපරිම රු.50,000 ක් පිරිනමන අතර මෙම උපරිමය වර්ෂ 12 කට වැඩි කාලයක සිට ඉහළ නැංවීම කෙරෙහි කළමනාකරණය අවධානය යොමුකර නොතිබුණි. එහෙත්, මණ්ඩලයේ කාර්ය මණ්ඩලය උක්ත රක්ෂණ ක්‍රමයෙන්ද ආවරණය වී තිබියදී භාණ්ඩාගාරයේ නිසි අවසරයකින් තොරව මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ලබාදෙන වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කිරීමේ ක්‍රමය යටතේ රෝහල්ගතවී ලබන ප්‍රතිකාර සහ රෝහල්ගත නොවී ලබන ප්‍රතිකාර සඳහා වර්ෂයකට ලබාදෙන වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණ දීමනාව පිළිවෙලින් රු.75,000 සිට රු.100,000 දක්වාත්, රු.40,000 සිට රු.60,000 දක්වාත් 2018 වර්ෂයේදී ඉහළ දැමීමට කටයුතු කර තිබුණි. ඒ අනුව, ශ්‍රම සුව රක්ෂණ ක්‍රමය යටතේ වෛද්‍යාධාර වියදම රු.මිලියන 11.84 ක්ව පැවතියදී, කාර්ය මණ්ඩලයේ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණ වියදම | මණ්ඩලයේ කාර්ය මණ්ඩලය 850 ක් පමණ වන අතර, සාමාජිකයන් සංඛ්‍යාව මිලියන 2.8 ක් පමණ වේ. ඒ අනුව සේවකයන්ට ලබා දෙන වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණ දීමනාව 2018 වසරේ සිට ඉහළ දැම්මට මණ්ඩලයේ ක්‍රියාත්මකව පවත්නා වෘත්තීය සමිති සංගම් යෝජනාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ශ්‍රමසුව රක්ෂණ ක්‍රමය යටතේ ලබාදෙන මුදල සංශෝධනය කිරිම මිලියන 2.8 ක් වූ සියළු සක්‍රිය සාමාජිකයන්ට අදාලව වන බැවින් ඒ සම්බන්ධයෙන් ගන්නා තීරණය මණ්ඩලයේ මූල්‍ය තත්වය බලපෑම් කිරිමට තරම් ප්‍රබල හේතුවක් විය හැකිය. | සාමාජිකයන්ගේ දායක මුදල් වලින් සැඳුම්ලත් අරමුලක් වන බැවින් සාමාජිකයන් සඳහා ප්‍රශස්ත ප්‍රතිලාභයක් ලබා දීමට කටයුතු කිරිම. |

| | | | |
|---|---|---|---|
| | රු.මිලියන 96.48 ක් වී තිබුණි. | | |
| (ඇ) | මණ්ඩලයේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් ක්‍රියාත්මක වෛද්‍යාධාර යෝජනා ක්‍රමය සඳහා සාමාජිකයා/කාලත්‍රයා සහ සෑම යැපෙන්නෙක් වෙනුවෙන්ම එක් අයෙක් සඳහා මාස්පතා අයකරනු ලබන දායක මුදල රු.30 ක් ලෙස 10/2011 අංක දරන පරිපාලන හා මානව සම්පත් චක්‍රලේඛනය මගින් සංශෝධනය කිරීමෙන් අනතුරුව වසර 10 තුල එම මුදලේ සංශෝධනයක් සිදුව නොතිබුණි. 2021 වසර සඳහා වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණ වියදම රු.මිලියන 97.98 ක් වූ අතර ඒ සඳහා කාර්ය මණ්ඩලයේ දායකත්වය රු.මිලියන 1.49 ක් එනම් සියයට 1.52 ක් පමණක් විය. ඒ අනුව ඉතිරි මුදල වූ රු.මිලියන 96.52 ක් එනම් සියයට 98.50 ක් මණ්ඩලයේ සාමාජික අරමුදලින් දැරීමට සිදු වී තිබුණි. | අයකරනු ලබන දායක මුදල වැඩි කිරීම සඳහා ඉදිරියේදී වෘත්තීය සමිති සමග සාකච්ඡා කර අදාල ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කෙරේ. | සාමාජිකයින්ගේ දායක මුදල් වලින් සමන්විත සාමාජික අරමුදලින් වියදම් දැරීමේ දී මනා කළමනාකරණයකින් හා සැලැස්මකින් යුක්තව කටයුතු කළ යුතුවීම. |
| (ඉ) | 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ (1) 20 වගන්තිය හා 1988 අංක 47 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල (සංශෝධන) පනතේ 7 වන වගන්තිය මගින් කරන ලද සංශෝධන ප්‍රකාරව, මණ්ඩලයට ස්වයං රැකියාලාභීන් ලියාපදිංචි කර ගැනීමට ඉඩකඩ සලසා දී ඇත. එහෙත් 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකාවේ වාර්තාගත වී ඇති ස්වයං රැකියාලාභීන් 2,658,735 කින් සාමාජිකයින් ලෙස අරමුදලට ලියාපදිංචි කර ගෙන ඇති සංඛ්‍යාව 42,951 ක් හෙවත් සියයට 1.66 ක් පමණ විය. අරමුදල් පනත මගින් විශේෂයෙන් නියම කර ඇති මෙම ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමට මණ්ඩලය තුල වෙනම අංශයක් ස්ථාපිත කර ක්‍රියාකාරී සැලැස්ම තුල උපායමාර්ග දක්වා තිබුණ ද, 2021 වර්ෂයේ දී අලුතින් ලියාපදිංචි කර ගෙන තිබූ සංඛ්‍යාව 256 ක් පමණක් විය. | ස්වයං රැකියා හා සංක්‍රමණික සේවා අංශයේ සාමාජිකත්වය ලබා ගැනීමට ස්වයං රැකියාලාභීන්ට අනිවාර්ය නොවන අතර ස්වේච්ඡාවෙන් සිදුකරනු ලබන්නකි. 2019 වර්ෂයේදී ස්වයං රැකියා හා සංක්‍රමණික සේවා අංශය හඳුන්වාදුන් නව්‍යකරණ වැඩසටහන යටතේ එම වර්ෂය සඳහා නව සාමාජිකයන් 1618 දෙනෙකු බඳවා ගැනීමට හැකි වූ අතර එය 2018 වර්ෂයට සාපේක්ෂව සියයට 418.8 ක වර්ධනයකි. 2020 වර්ෂයේදී රට තුළ කොවිඩ් වසංගතය ව්‍යාප්තවීමත් සමඟ එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර නව්‍යකරණ වැඩසටහනේ ප්‍රතිඵල ලෙස 2020 වර්ෂය සඳහා වසංගත තත්ත්වය තුළ නව සාමාජිකයන් 481 දෙනෙකු බඳවාගෙන ඇති අතර 2021 වර්ෂයේදී නව සාමාජිකයින් 256 ක් බඳවාගෙන ඇත. | ස්වයං රැකියාලාභීන් ලියාපදිංචි කර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. |
| (ඊ) | සංස්ථාපිත පනත අනුව මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා මණ්ඩලයේ සභාපතිවරයා වන්නේය. කෙසේ වුවද, මූල්‍ය කටයුතු සම්බන්ධ ආයතනයක් | මීට අදාළව 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත සඳහා යෝජිත සංශෝධන කෙටුම්පත් කර මුදල් අමාත්‍යාංශය වෙත අනුමැතිය සඳහා යොමු | අදාල අනුමැතීන් කඩිනමින් ලබාගෙන පනතෙහි සංශෝධනයන් සිදු |

| | | | |
|---|---|---|---|
| | ලෙස මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා එහි සභාපතිවරයා විය යුතු බවට වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 5(2) වගන්තිය සංශෝධනය කල යුතු බවට 2016 අගෝස්තු 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ දී නිර්දේශ කර තිබුණි. එසේ වුවද, 2021 වර්ෂය අවසාන වන විටත් පනතට අවශ්‍ය අදාල සංශෝධනයන් සිදුකර නොතිබුණි. | කිරීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් දෙපාර්ශවයේ නිලධාරීන් අතර පැවැත්වූ සාකච්ඡාවේදී මුදල් අමාත්‍යාංශයේ අදහස් හා යෝජනා අනුව නැවත කෙටුම්පත් කරනු ලැබූ අදාළ සංශෝධන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කිරීමට නියමිතය. | කිරිමට කටයුතු කල යුතු වේ. |
| (උ) | 1995 වර්ෂයේ සිට අඛණ්ඩව වැඩිවෙමින් පවතින හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ රු.මිලියන 21.70 ක් සහ 2001 වර්ෂයේ සිට පැවත එන රඳවාගත් ප්‍රතිලාභ රු.මිලියන 17.29 ක් වශයෙන් එකතුව රු. මිලියන 38.99 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අදාළ සාමාජිකයින් හඳුනාගෙන නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | හිමිකම් නොපාන මරණ ප්‍රතිලාභ ගිණුමට අදාලව 2022 මැයි මස 31 දක්වා රු.මිලියන 2.45 ක මුදලක් හිමිකරුවන් 23 දෙනෙකු වෙත ගෙවා ඇත. ආපසු එවන ලද ප්‍රතිලාභ ගිණුමට අදාලව 2022 මැයි මස වන විට ප්‍රතිලාභ හිමිකරුවන් 71 දෙනෙකු විසින් ඉල්ලුම් කර ඇති රු.මිලියන 3.07 ක මුදල් ගෙවා ඇත. ඉල්ලුම් නොකල සුභසාධන ප්‍රතිලාභ ගිණුමට අදාලවන ප්‍රතිලාභීන් 24 දෙනෙකුට 2022 මැයි මාසය දක්වා රු.මිලියන 1.42 ක මුදලක් නැවත ගෙවීම් කර ඇත. | නිරවුල් නොකර පවතින හිමිකම් නොපාන මරණ ප්‍රතිලාභ, රඳවාගත් ප්‍රතිලාභ වෙන් වෙන්ව හඳුනාගෙන නිරවුල් කිරිමට සුදුසු වැඩපිළිවෙළක් සකස් කිරිම කළමනාකරණයේ වගකීම වේ. |
| (ඌ) | 1994 වර්ෂයේ සිට 2009 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව උසස් පෙළ සමත් සිසුන්ට ගෙවිය යුතු හිමිකම් නොපෑ ශිෂ්‍යත්ව මුදල් රු.මිලියන 1.27 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදලට අදාළ හිමිකම්ලාභීන් සම්බන්ධ කර ගැනීමට ප්‍රමාණවත් තොරතුරු නොමැති බැවින් මෙම ශිෂ්‍යත්ව මුදල් ගෙවීමට නොහැකි වීමේ ප්‍රායෝගික ගැටළුවක් මතුවී ඇත. ඒ අනුව මෙම මුදල් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව නැවත මණ්ඩලීය ගිණුමට බැර කරන ලෙස 2022 ජුනි 09 දින මුදල් අමාත්‍යාංශයේදී පැවති විගණන හා කළමණාකරණ කමිටු රැස්වීමේ දී උපදෙස් දෙන ලදි. | අදාල හිමිකම්ලාභින් හඳුනාගැනිමටත් විධිමත් වැඩපිළිවෙළක් සකස් කර මෙම ශේෂයන් නිරවුල් කිරිමට කටයුතු කල යුතු වීම. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට ලැයිස්තුගත සමාගම් 8 ක සිදුකල සාමාන්‍ය පිරිවැය රු.මිලියන 287.78 ක් වූ ආයෝජනයන් 2015 වර්ෂයේ සිට කොටස් වෙළඳපොලේ ගනුදෙනු කර නොතිබීම හේතුවෙන් මණ්ඩලයට ප්‍රාග්ධන ලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | සමාගම් 8 න් සමාගම් 3ක් සංචාරක ක්ෂේත්‍රයට අදාල හෝටල් සමාගම් වන බැවින් රටතුළ සංචාරක ව්‍යාපාරය දියුණු වන වාතාවරණයක් තුළ සත්‍ය පිරිවැයට වඩා කොටසක වෙළඳපොළ මිළ ගණන් ඉහළ අගයක් ගන්නා විට ප්‍රාග්ධන ලාභ සහිතව විකිණීමට අපේක්ෂා කරමු.<br>ඉතිරි සමාගම් 5 හි ද කොටස් මිල සත්‍ය පිරිවැයට වඩා ඉහළ අගයක් ගන්නා විට විකුණා ලාභ ලැබීමට අපේක්ෂා කරමු. | සාමාජිකයින්ට ඉහළ ප්‍රතිලාභ ලැබෙන පරිදි ආයෝජන කළඹ කළමනාකරණය කළ යුතු විම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට ලැයිස්තුගත සමාගම්වල සිදුකල ආයෝජන අතුරින් සමාගම් 15 ක සිදුකර තිබූ ආයෝජනයන්ගේ සාමාන්‍ය පිරිවැය රු.මිලියන 1,242.24 ක් වූ කොටස් සඳහා 2021 වර්ෂයේ ලාභාංශ ආදායමක් ලැබී නොතිබිණි. ඉන් සමාගම් 2 ක් සඳහා 2015-2021 කාලයට ද, සමාගම් 2 ක් සඳහා 2019-2021 කාලයට ද, සමාගම් 3 ක් සඳහා 2020-2021 කාලයට ද ලාභාංශ ලැබී නොතිබුණි. | 2019 වසරේ සිදු වූ පාස්කු දින ප්‍රහාරය සහ 2019 සිට 2021 වසර දක්වා පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් බොහෝ සමාගම්වල ක්‍රියාකාරිත්වය පහත වැටුණි. ප්‍රාග්ධන වෙළඳපොළ යථා තත්වයට පත් වී ලාභදායි තත්වයන් යටතේ ලාභාංශ ඉදිරියේදී ප්‍රකාශයට පත් කරනු ඇතැයි අපේක්ෂා කරමු. | සාමාජිකයින්ට ඉහළ ප්‍රතිලාභ ලැබෙන පරිදි ආයෝජන කළඹ කළමනාකරණය කළ යුතු වීම. |
| (ඇ) | National Equity අරමුදලේ පිරිවැය රු.මිලියන 41.68 ක් වූ ඒකක සඳහා 2020 හා 2021 වර්ෂ වෙනුවෙන් ලාභාංශ ලැබී නොතිබුණි. | National Equity ඒකක භාර අරමුදලේ ආයෝජනය දිගුකාලීන ආයෝජනයක් වන අතර ආයෝජිත පිරිවැය රු.මිලියන 41.7 කි. එම පිරිවැය මෙන් 4 ගුණයක් ඉක්මවූ රු.මිලියන 179.9 ක මුදලක් ආයෝජිත වසරේ සිට 2019 වසර දක්වා ලාභාංශ වශයෙන් මණ්ඩලයට ලැබී ඇත. එහෙත් 2020/2021 වසර වලදී රට තුළ පැවති කොරෝනා වසංගතය ව්‍යාප්ත වීම හේතුකොට ගෙන බොහෝ ආයතනවල ලාභාංශ ගෙවීමක් එම වසරවල නොවුණි. | සාමාජිකයින්ට ඉහළ ප්‍රතිලාභ ලැබෙන පරිදි ආයෝජන කළඹ කළමනාකරණය කළ යුතු වීම. |
| (ඈ) | මණ්ඩලයට අයත් නවම් මාවතෙහි පිහිටි ඉඩමක රථගාලක් පවත්වාගෙන යනු ලබන අතර ඇතැම් පාර්ශවයන් විසින් මාසික කුලී පදනම මත එහි වාහන නවතා තැබීමේ පහසුකම් ලබාගනු ලැබේ. එහෙත් අදාල ගනුදෙනුකරුවන් සමඟ මණ්ඩලය විසින් ගිවිසුමකට එළඹ නොමැති බව නිරීක්ෂණය විය. එම ගනුදෙනුකරුවන්ගෙන් මාස 03 ක ආරක්ෂක තැන්පතුවක් අයකලයුතුව පැවතියද, 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 3.35 ක ලැබිය යුතු මුදලක් පැවති ගනුදෙනුකරුවන් 61 දෙනෙකුගෙන් එසේ ආරක්ෂක ඇප තැන්පතුවක් ලබාගෙන නොතිබුණි. එසේම, ඇතැම් ගනුදෙනුකරුවන්ගෙන් ලබාගෙන ඇති ආරක්ෂක ඇප තැන්පතු මුදලට සාපේක්ෂව 2021 දෙසැම්බර් 31 දිනට එම ගනුදෙනුකරුවන්ගෙන් අයවිය යුතු හිඟ ශේෂය ඉතා ඉහළ අගයක් ගන්නා අවස්ථා පැවතුණි. ඒ අනුව, ගනුදෙනුකරුවන් 19 කට අදාලව ලැබිය යුතු මුදල රු.මිලියන 1.78 ක් වුවද, | දැනට නවම් මාවත රථගාල භාවිතා කරන ගනුදෙනුකරුවන් සමඟ වලංගු ලිඛිත ගිවිසුමකට එළඹ නොමැති අතර, ඉදිරියේදි නිති අංශයේ ද සහයෝගය ඇතිව ගිවිසුමක් සකස් කොට අදාල ආයතන සමග ගිවිසුම් ගත වීමට අපේක්ෂා කරයි.<br>2021 දෙසැම්බර් 31 වන දිනට ණයගැතියන් 61 දෙනෙකුගෙන් රු.මිලියන 3.35 ක් අයවිය යුතු ලෙස සඳහන් වුවද, 2022 මැයි 31 දින වන විට එම ශේෂය රු.676,031.39 ක් පමණ විය. තවද, එම ණයගැතියන්ගෙන් රු.447,053.72 ක මුදලක් දැනට රථගාලෙන් ඉවත්ව ගොස් සිටින අක්‍රීය ණයගැතියන් නියෝජනය කරනු ලබයි. එම ගණුදෙනුකරුවන් බොහෝමයක් 2017 ජුලි 01 දිනට ප්‍රථම ලියාපදිංචි වී ඇති හා 2018 වසර වනවිට ඉවත්ව ගොස් සිටින ගනුදෙනුකරුවන් වේ. ඒ අනුව මුදල් අයකර ගත නොහැකි ණය ගැතියන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් පසු ගිණුම් පොත්වලින් ලියා හැරීමට කටයුතු කරනු ලබයි. | රථගාලෙහි සේවය ලබා ගන්නා ආයතන සමඟ විධිමත් ගිවිසුම් වලට එළඹීම, ප්‍රමාණවත් ආරක්ෂණ ඇපකරයන් ලබා ගැනිම සහ හිඟ මුදල් අයකර ගැනිමට කටයුතු කිරිම. |

| | | | |
|---|---|---|---|
| | රඳවාගත් ආරක්ෂක තැන්පතුව රු.867,497 ක් පමණක් බව නිරීක්ෂණය විය. | | |
| (ඉ) | මණ්ඩලය රජයේ සුරැකුම්පත්වල අරමුදල් ආයෝජනය කරන ප්‍රධාන පෙලේ ආයතනයක් වුවද සුරැකුම්පත් වෙන්දේසි වලදී සෘජුවම මිල ගණන් ඉදිරිපත් කිරීමේ පහසුකම (Direct Bidding Facility) ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් ලබාගෙන නොතිබුණි. 2016 අගෝස්තු 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවෙහි දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාථමික ගනුදෙනුකරුවකු (Primary dealer) ලෙස ලියාපදිංචි වන ලෙසට නියෝග කර තිබුණ ද 2021 දෙසැම්බර් 31 දින වන විටත් එසේ සිදුකර නොතිබුණි. | මෙම පහසුකම ලබා ගැනීම හා පවත්වා ගෙන යෑම සඳහා අධික පිරිවැයක් සහිතව මණ්ඩලයට දැරීමට සිදු වේ. සේවක බඳවා ගැනීම් සම්පූර්ණ කිරීමෙන් පසුව සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසුව මහ බැංකුව විසින් දන්වා ඇති අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා කටයුතු කළ හැක. 2022 වසරේ සිට නව සේවක බඳවා ගැනීම් අත්හිටුවීම මේ සම්බන්ධව වැඩිදුර කටයුතු කිරීමට බාධාවක් වී ඇත. මෙම පහසුකම රාජ්‍ය බැංකුවක් වන මහජන බැංකුව මගින් වර්තමානයේ කිසිදු වියදමකින් තොරව සහ අමතර සේවකයන් යෙදවීමකින් තොරව ලබා ගනී. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවෙන් ලබාදුන් නියෝග ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ වගකීම වේ. |
| (ඊ) | 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව මණ්ඩලයෙහි ජංගම නොවන වත්කම් අයිතම 95 කට අදාලව භාණ්ඩ 1456 ක ඌනතාවයක්ද, වත්කම් අයිතම 78 කට අදාලව භාණ්ඩ 825 ක අතිරික්තයක්ද, වත්කම් අයිතම 48 කට අදාලව අබලි භාණ්ඩ 309 ක්ද, හඳුනාගෙන තිබුණද, ඒ සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | රටේ පැවති වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අවසන් කිරීමට 2021 නොවැම්බර් දක්වා කාලය ගත විය. ඒ අතරතුර 2021 වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණය ද සිදු කරන ලද අතර එහි වාර්තාව 2022 වර්ෂයේ ජූනි මාසයේ දී අවසන් කරන ලදී. මේ වනවිට එහි හේතු කැඳවීම් කර ඇති අතර, මෙම වාර්තා දෙකෙහිම ඇති කරුණු සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීමට බලාපොරොත්තු වේ. | සුදුසු ක්‍රියාමාර්ග කඩිනමින් ගෙන මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතුවීම. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 29 දින එළඹි ගිවිසුම ප්‍රකාරව 2022 ජනවාරි 04 වන විට මණ්ඩලයට ලැප්ටොප් පරිගණක 228 ක් රු.37,260,900 ක මුදලකට සැපයීමට e-wis ආයතනය එකඟ වී තිබුණද 2022 මැයි මස වන විට ඇණවුමෙන් පරිගණක 90 ක් පමණක් සපයා තිබුණි. තවද, ගිවිසුම් ප්‍රකාරව නොසැපයූ තොගය වෙනුවෙන් එහි වටිනාකමින් සියයට 0.5 ක වටිනාකමක් සතියක දඩ මුදලක් ලෙස අය කරගෙන නොතිබුණි. | රටෙහි පැවති ආර්ථික වාතාවරණය හේතුවෙන් ඉතිරි භාණ්ඩ තොගය සැපයීමට නොහැකිවූ බව සැපැයුම්කරු විසින් පවසන ලදී. ඒ අනුව මෙයට අදාල නීතිමය වශයෙන් ගතහැකි ක්‍රියාමාර්ගය පිළිබඳ උපදෙස් සඳහා අප මණ්ඩලයෙහි නීති අංශය වෙත යොමු කර ඇත. තවද, කාර්ය සාධන වගකීම් (**Performance Guarantee**) හි සඳහන් භාණ්ඩ වල මිල අදාල සියයට 10 ක මුදල් නිෂ්කාෂනය කිරීමට ඇති හැකියාව පිළිබඳ අවධානය යොමු කොට ඇත. | නීතිමය උපදෙස් පරිදි කටයුතු කිරීම. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 අගෝස්තු 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දි මණ්ඩලයේ සාමාජික අරමුදලේ ආයෝජන කළමනාකරණ කටයුතු සඳහා වරලත් මූල්‍ය විශ්ලේෂක තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු කඩිනමින් පත්කරන ලෙස මණ්ඩලයට උපදෙස් ලබාදී තිබුණද, 2022 මැයි විගණිත දිනවන විටත් එම තනතුර සඳහා නිලධාරියෙකු බඳවාගෙන නොතිබුණි. | මණ්ඩලය විසින් 2020 වසර මැද භාගයේදී සාමාන්‍යාධිකාරි තනතුරෙහි පුරප්පාඩුව සම්පූර්ණ කරන ලද අතර, ආයතනයේ ආයෝජන අංශයේ පුරප්පාඩුව 2017 වසරේ සම්පූර්ණ කරන ලදී. වර්තමානයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් සාමාජිකයෙකු බැංකු ක්ෂේත්‍රයට අදාල ආයතනවල අධ්‍යක්ෂවරයෙක් වශයෙන් කටයුතු කළ පළපුරුදු නිලධාරියෙක් වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයින්ද රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි දක්ෂ පළපුරුදු නිලධාරින් වේ. එම නිසා ආයතනයේ වර්තමාන කටයුතු සිදු වන්නේ පුළුල් මගපෙන්වීමක් යටතේය. වර්තමානයේ ආයෝජන අංශය ඉතා පළපුරුදු හා දක්ෂ සේවක මණ්ඩලයකින් සමන්විත අතර, එම කටයුතු ස්වාධීනව කරගෙන යාමට අවශ්‍ය දැනුම හා ශක්තිය ඔවුන් සතුව ඇත. තවද CFA සුදුසුකම් ඇති පුද්ගලයෙකු පත්කර ගැනීම සඳහා විශාල මුදලක් මණ්ඩලයට වැය කිරීමට සිදුවන අතර, මණ්ඩලයේ පවතින සේවක වැටුප් හා ප්‍රතිලාභ තත්ත්වය මත එවැනි පුද්ගලයෙකුගේ සේවය ලබා ගැනීමට අපහසුය. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවෙහි ලබා දුන් උපදෙස් සම්බන්ධයෙන් කටයුතු කිරිමට අවධානය යොමු කිරිම. |